Article 11
12
13(2)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2020-12-21 |
|---|---|---|---|

පැමිණිලිකාරිය : බී. රේණුකා මිය.
නො. 375, සුප්‍රීම් පාර්ක් ,
කුඹුක වත්ත, ගෝනපොල.

වගඋත්තරකරුවන් :
1. පො.ප රේණුක මහතා,
2. පො.ප බණ්ඩාර මහතා,
3. පො.කො 29561 . . බණ්ඩාර මහතා,
4. පො.කො 69714 ජයතුංග මහතා,
5. පො.කො 81014 සඳරුවන් මහතා,
6. පො.කො.රි 14572 රූපසිංහ මහතා,

පොලිස් ස්ථානය, මරදාන

<u>පැමිණිලි අංකය : HRC/887/15</u>

ඉහත අංක දරණ පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව විසින් යොමු කර ඇති 2020.12.14 දිනැති නිර්දේශය හා බැඳේ.

එම නිර්දේශයේ අවසන් පිටුවේ නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු දිනය සටහන් කිරීමේදී සිදුවූ දෝෂයකින් එය 2021.12.14 ලෙසට සටහන් වී ඇති අතර, එය 2021.01.14 ලෙස නිවැරදි විය යුතු බවට පාර්ශවයන් වෙත මෙයින් දන්වා සිටිමි.

මේ හේතුවෙන් ඔබට සිදුවූ අපහසුතාවය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බවද දන්වමි.

අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-
01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

03. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 08.

B/


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2020-12-14

පැමිණිලි පාර්ශවය : බී.රේණුකා මිය.
අංක : 375. සුප්‍රීම් පාර්ක්.
කුඹුක වත්ත. ගෝනපොල.

වගඋත්තර පාර්ශවය : 01. පො.ප. රේණුක මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

02. පො.ප. බණ්ඩාර මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

03. පො.කො. 29561 රූපසිංහ මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

04. පො.කො. 69714 ජයතුංග මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

05. පො.කො. 81014 සඳරුවන් මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

06. පො.කො.රි. 14572 රූපසිංහ මහතා.
පොලිස් ස්ථානය.
මරදාන.

පැමිණිලි අංකය : **HRC/887/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා වන ගීගනගේ චම්පික උදය කුමාර යන අය 2015.03.09 වන දින පෙ.ව.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

9.00 ට පමණ රාජගිරිය. බණ්ඩාරනායකපුර. නො. 665/27 දරණ ලිපිනයේදී මරදාන පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් බවත්. ඒ සඳහා නිලධාරින් 05 දෙනෙකු පමණ සහභාගි වූ බවත්. අත්අඩංගුවට ගැනීමෙන් පසුව පහරදීම් සිදුකළ බවත්ය. පසුව රන් මාලයක් කොල්ලකෑම සහ අත්බෝම්බයක් ලග තබා ගැනීම යන චෝදනා යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවද සඳහන් කර ඇත. පැමිණිලිකාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ. එම අපරාධ වලට තම ස්වාමි පුරුෂයාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවයි.

එසේම. 2015.03.09 වන දින සිට 2015.03.13 වන දින දක්වා පොලිස් ස්ථානයේ තම ස්වාමි පුරුෂයාව නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටි බවද පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

අගතියට පත් ගීගනගේ චම්පික උදය කුමාර යන අයගේ කරුණු දැක්වීම :-

අගතියට පත් ගීගනගේ චම්පික උයද කුමාර යන අය ප්‍රකාශ කර ඇත්තේ. තමා 2015.03.09 වන දින පෙරවරු 9.00 ට පමණ තම නිවස ඉදිරිපිට ත්‍රිරෝද රථය සෝදමින් සිටියදී පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන එම අවස්ථාවේදීම දෑස් දෙක බැඳ ජීප් රථයට දමා ගත් බවත්. එහිදී තමාට පහරදුන් බවත්. ඇස් බැඳීම නිසා පහරදුන් අය හඳුනාගැනීමට නොහැකි වූ බවත්ය. ඉන්පසුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇස් නිරාවරණය කිරීමෙන් පසුව තමා මරදාන පොලිස් ස්ථානයේ සිටින බවට හඳුනාගත් බවත්. පසුව තමාගේ යට ඇඳුම් හැර අන් සියළු ඇඳුම් ගලවා හරහට පොල්ලක් දමා පොල්ල මේසයේ ගැට ගසා අපරාධ අංශයේ ස්ථානාධිපති පො.ප. රේණුක යන අය විසින් පහරදුන් බව සඳහන් කර ඇත. පොලිස් ස්ථානයේ දින 3 ක් රඳවා තබා ගත් බවත්. පසුව 2015.03.13 වන දින බොරු චෝදනාවක් මත අධිකරණයට ඉදිරිපත් කළ බවත්. මේවනවිට තමාට විරුද්ධව අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ රන් මාලයක් කඩාගැනීම සම්බන්ධයෙන් නඩුවක් ද. හෝමාගම අධිකරණයේ රන් මාලයක් කඩාගැනීම සම්බන්ධයෙන් නඩුවක් ද. වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ රන් මාලයක් කඩා ගැනීමක් සම්බන්ධයෙන් නඩුවක් ද පවතින බවත්. ඉන් මාසයකට පමණ පසුව බෝම්බයක් ලග තබා ගත් බවට සඳහන් කරමින් මාලිගාවත්ත මහේස්ත්‍රාත් අධිකරණයේ ද නඩුවක් ගොනු කර ඇති බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

2015.03.12 වන දින බල අපරාධ 64/15 යටතේ අදාළ සැකකරුවන් සම්බන්ධයෙන් ලද තොරතුරක් අනුව පො.කො.රි. 14572 රූපසිංහ විසින් පදවන ලද DC 0322 දරණ රථයෙන් උ.පො.ප. බස්නායක. පො.සැ. 20252 (දැනට පො.ප.) බණ්ඩාර. පො.කො. 29561 රූපසිංහ. පො.කො. 60624 නිශාන්ත. පො.කො. 69714 ජයතුංග. පො.කො. 70805 කොඩිතුවක්කු. පො.කො. 81014 සඳරුවන්. පො.කො. 81845 දිසානායක යන නිලධාරින් සමග මරදාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වන පො.ප. මහේෂ් මංගල රේණුක යන අය පැය 14.20 ට ස්ථානයෙන් පිටව ගොස් නැවත පැය 16.15 ට ස්ථානයට පැමිණ ඇති බවට සඳහන් කර ඇති අතර. මෙම පැමිණිලිකරු සහ තවත් සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත් බවත්. ඔහු සන්තකයේ තිබී දේශීය නිෂ්පාදිත අත්බෝම්බ දෙකක් ද. WP QW 5240 දරණ කොළ පාට ත්‍රීවිල් රථය ද.

WP VU 9468 දරණ යතුරු පැදිය ද අත්අඩංගුවට ගත් බවත්, එක් සැකකරුවෙකු සන්තකයේ හෙරොයින් ප්‍රමාණයක් ද තිබූ බවත් ප්‍රකාශ කර ඇත. මෙම සැකකරු වන චම්පික උදය කුමාර යන අයව පැය 15.40 ට රාජගිරිය මැතිවරණ ලේකම් කාර්යාලය අසලදී ඔහු විසින් පදවන ලද ඉහත සඳහන් ත්‍රිරෝද රථය පදවමින් සිටියදී දේශිය අත්බෝම්බයක් සමඟ අත්අඩංගුවට ගත් බවත් ප්‍රකාශ කර ඇත.

ඉහත ත්‍රිරෝද රථය ද ඔහු සන්තකයේ තිබූ දේශිය නිෂ්පාදිත අත්බෝම්බය ද සැකකරු නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 95/15 අනුව ස්ථානයට ඉදිරිපත් කල බවත්, මෙම සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව මරදාන පොලිස් වසමේ පාදුක්ක පොලිස් වසම සහ වත්තල පොලිස් වසම සහ මොරගහහේන පොලිස් වසම ආදියේ රන් මාල කොල්ලකෑම සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගත් අතර, ඔහු සන්තකයේ තිබූ දේශිය නිෂ්පාදිත අත්බෝම්බය මාලිගාවත්ත ප්‍රදේශයේ තුසිත් යන අය සමග එක්ව පිළියෙල කල එකක් බව ප්‍රකාශ කළ බවද සඳහන් කර ඇත.

වින්දිතයා පැදවූ ත්‍රිරෝද රථය මිලට ගනු ලැබුවේ රන් මාල කොල්ලකෑ මුදල් වලින් රු. 80,000/- ක් ගෙවා මාසිකව රු. 14,000/- ක් බැගින් ගිනැන්ස් ගෙවීමට ලබාගත් එකක් බවට අනාවරණය වූ බවද සඳහන් කර ඇත. එසේම සැකකරුවන්ව අධිකරණ වෛද්‍ය පෝරම් අංක 48, 49 සහ 50 යටතේ කොළඹ ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කල අතර, එදින අධිකරණ වෛද්‍යවරයා නොසිටි බැවින් 2015.03.13 වන දින අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කල බවද පසුව මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත සැකකරුවන් ඉදිරිපත් කල අතර, සැකකරුවන් වෙනුවෙන් පෞද්ගලිකව නීතිඥවරයෙක් ඉදිරිපත් වූ බවත්, ඔහු විසින් නීතිවිරෝධි අත්අඩංගුවට ගැනීමක් හෝ පහරදීමක් සිදුව ඇති බවට පැමිණිලි කර නොමැති බවත්, එසේම බන්ධනාගාරය වෙත ද පැමිණිලි කර නොමැති බවත් සඳහන් කර ඇත. මෙම පැමිණිලිකරු ඔවුන්ට විරුද්ධව මෙම පැමිණිල්ල සිදුකරනු ලැබුවේ පැමිණිලිකරුගේ මෙම ත්‍රිවිල් රථය අධිකරණයට ඉදිරිපත් කිරීම නිසා ඇතිවූ පෞද්ගලික අමනාපයක් මත බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම පැමිණිකාර චම්පික උදය කුමාර යන අය දඩුවම් ලද දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවෙකු බවත්, මොහුට විරුද්ධව මහාධිකරණයේ අංක 290/11 යටතේ මිනීමැරුම් චෝදනාවක් සඳහා නඩුවක් ඇති බවත්, එසේම දොන් තුසිත යන අය පීඩාකාරී ආයුධ පනත යටතේ දඩුවම් ලද දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවෙකු බවත්, අනෙක් සැකකරුවන් වන තුසිත් චන්දන කුමාර යන අය ද ලියාපදිංචි අපරාධකරුවෙකු බවත් සඳහන් කර ඇත. මෙම පැමිණිලිකරු හැර අනෙක් සැකකරුවන් දෙදෙනා ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද රන් මාල කඩා ගැනීමේ චෝදනාවන්ට වරද පිළිගැනීමෙන් පසුව අදාල රන් මාල පැමිණිලිකරුවන් වෙත මුදා හැර ඇති බවත් සඳහන් කර ඇත.

වින්දිතයාව අධිකරණ වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කර ඇති බවට සඳහන් වන හෙයින් අදාල අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවා ඇති අතර, එම අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව රෝගියා විසින් ලබා දෙන ලද කෙටි ඉතිහාසයේදී අධිකරණ වෛද්‍යවරයාට පවසා ඇත්තේ, තමාව 2015.03.10 වන දින පෙරවරු 9.00 ට පමණ රාජගිරියේදී අත්අඩංගුවට ගත් බවත්, පොලිසිය විසින් රන් මාල කඩාගැනීමකට සැක පිට පහරදුන් බවත්ය.

අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල එකක් ඇති බව සඳහන් වන අතර, එය සෙ.මී. 13 × 8 ප්‍රමාණයේ පිට ප්‍රදේශයේ වම් පැත්තේ ඇති බවත් සඳහන් කර ඇත. තුවාලය සම්බන්ධයෙන් වෛද්‍යවරයා මතය ඉදිරිපත් කිරීමක් සිදුකර නැත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීම සිදුකරනු ලැබුවේ 2015.03.09 වන දින බවයි. නමුත්, වින්දිතයා විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණයේදී රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ අත්අඩංගුවට ගත් දිනය ලෙස ප්‍රකාශ කර ඇති බවට සඳහන් වන්නේ 2015.03.10 වන දිනය. නමුත් වගඋත්තරකරුවන් කරුණු දැක්වීමේදී අදාල සැකකරුව අත්අඩංගුවට ගනු ලැබුවේ 2015.03.12 වන දින බවත්, අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ 2015.03.13 වන දින බවත් දක්වා ඇත.

කෙසේ වෙතත් පැමිණිලිකාරිය විසින් චම්පික උදය කුමාර යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 2015.03.11 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇති අතර, එම පැමිණිල්ලට අනුව කොමිසමේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මරදාන පොලිස් ස්ථානයෙන් විමසා ඇත. පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. සරත් පෙරේරා මහතා විසින් අදාල අත්අඩංගුවට ගැනීම සනාථ කර ඇත.

වින්දතයා විසින් ඔහුට අමානුෂික අන්දමින් පහරදුන් බවට කරුණු දක්වන අතර, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ඔහුගේ පිට ප්‍රදේශයේ සෙ.මී. 13 × 8 ප්‍රමාණයේ තුවාලයක් ඇති බවට සඳහන් වන බවද නිරීක්ෂණය වේ.

චම්පික උදය කුමාර යන අයට විරුද්ධව හෝමාගම, මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණ වල යොමු කර ඇති රන් මාල කඩාගැනීම් සම්බන්ධ නඩු වලින් නිදහස් වී ඇති අතර, අවිස්සාවේල්ල සහ වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩු විභාග වෙමින් පවතින බවද නිරීක්ෂණය වේ.

තවද, වින්දිතයා විසින් අපරාධ අංශයේ ස්ථානාධිපති පො.ප. රේණුක යන අය තමාට පහරදුන් බවට සඳහන් කර ඇති බව ද නිරීක්ෂණය වේ.

නිගමනය :-

වින්දිතයාව 2015.03.11 වන දින වනවිටත් අත්අඩංගුවේ සිටින බවට මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ තහවුරු වී ඇති අතර, සැකකරුව අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත්තේ, 2015.03.13 වන දින බවටද අනාවරණය වී ඇත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 37 වන වගන්තිය අනුව සාමාන්‍ය නීතිය යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු විමර්ශනය අවසන් වූ වහාම හෝ පැය 24 ක් තුළ පළමු අවස්ථාවේදීම එනම්, අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන යන කාලය සහ පොලිස් ස්ථානයේ සිට අධිකරණයට

ඉදිරිපත් කරන ලද ගණනය නොකොට පැය 24 ක් තුළදී මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව අගතියට පත් චම්පික උයද කුමාර යන අයව නීතිවිරෝධී රඳවා තබා ගැනීමක් සිදුකර ඇති බවට තහවුරු වේ. පාරුක් එදිරිව ශිවන්ති සහ වෙනත් අය SCFR 156/95 හිද දක්වා ඇත්තේ, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාවේ පරමාර්ථය වන්නේ, විධායක ක්‍රියාවලිය මගින් තම පෞද්ගලික නිදහස අහිමි වූ පුද්ගලයෙකුට තම නඩුව මධ්‍යස්ථ පුද්ගලයෙකු ඉදිරියේ එනම්, විනිශ්චයකාරයෙකු ඉදිරියේ තැබීමේ වාසිය ලබා ගැනීම" බව දක්වා ඇත. නමුත් වින්දිත පුද්ගලයා මෙහිදී දින කිහිපයක් රඳවා තබාගනිමින් නීතියේ නියම කර ඇති කාර්යය පටිපාටියට බාහිරව කටයුතු කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වන බැවින් එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවද උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

එසේම වෙල්ලමුරුගේසු එදිරිව නීතිපති සහ තවත් අය යන නඩුවේදී වධහිංසාවට සහ හිරිහැර වලට එරෙහිව 11 වන ව්‍යවස්ථාවේ සහතික කර ඇති කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට යන්නෙහි සුවිශේෂී තත්ත්වය පෙන්වා දී ඇත.

එසේම, කමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු නඩුවේදී "කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික, අවමන් සහගත සැලකිල්ලකට හෝ නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරයි. එමනිසා එවන් තත්ත්වයන් ව්‍යවස්ථාවන් මගින් තහනම් කරනු ලැබ ඇති බවත්, එය කිසිදු සීමාවකට හෝ අඩු කිරීමකට හෝ යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවත්, අපරාධකරුවෙකු වුවද එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම් වලට ඇති සම්පූර්ණ හිමිකම ලැබෙන බවත්, පොලිස් බලකායන්ට ද මෙම අයිතිවාසිකම් ආරක්ෂා කොට සුරැකීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යොමු කර ඇති අතර, කිසිදු අවස්ථාගත කරුණක් යටතේ වුවද මෙම අයිතිය ප්‍රතික්ෂේප කිරීමකට හෝ අඩු කිරීමට හෝ සීමාකිරීමක් නොකල යුතු බවට" පෙන්වා දී ඇත.

ඒ අනුව මෙම වින්දිතයාගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කොට ඇති 11, 12 සහ 13(2) යන ව්‍යවස්ථාවන් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

01. ඒ අනුව පළවන වගඋත්තරකරු වන පො.ප. රේණුක යන අය විසින් වින්දිතයා වෙත රු. 25,000/-ක මුදලක් ද,

02. අනෙක් වගඋත්තරකරුවන් සියළු දෙනා එනම් 2-6 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් වින්දිතයා වෙත රු. 25,000/- ක මුදලක් ද ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. තවද, මෙම වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කිරීම සුදුසු වේ.

2021-12-14 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත = 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. නීතිපති.
නීතිපති දෙපාර්තමේන්තුව.
කොළඹ 12.

සැ.යු - අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

B/ග